මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

## මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල භාෂාව හා සාහිත්‍යය | 7 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ........................................................................................................................

### I කොටස

පළමු කොටසෙහි අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අදින්න.

01. i.අළුයම ii.නිළදරු iii.පළතුරු iv.සමනොළ
02. i.කන්ඨජ ii.ආන්ඩුව iii.අභිකූණ්ඨීක iv.සණ්ඨාර
03. i. කොට්ඨාස ii.විශ්මය iii.ආශ්වාදය iv. ආභාෂය
04. i.සියළු ii.ඊලග iii.ළපලු iv. ලය

මුලින් දී ඇති පදයට අර්ථයෙන් සමාන පදය තෝරා යටින් ඉරක් අදින්න.

05. ප්‍රගතිය ;- i.සුගතිය ii.විරතිය iii.පුහුණුව iv.දියුණුව

06.ප්‍රවීන :- i.නවීන ii.ප්‍රාචීන iii.නිපුණ iv.ප්‍රතිවීන

07. පහත සඳහන් වචනවල යෙදී ඇති පිල්ලම් නිවැරදිව නම් කරන්න.

- සරු:- ………………………… උදාන:- …………………………..

මුලින් දී ඇති වචනයේ අර්ථයට නොගැළපෙන අර්ථය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අදින්න.

08. සඳ - (තරුපති, චන්ද්‍ර, සිසි, සහසකර)

09. අහස - (ගගන, සිලිලාර,අඹර, නුබ ගැබ)

10. දී ඇති පදයට විරුද්ධ පදය ලියන්න.

උත්තම :- ........................... කම්මැළි:- .................................

පත් කුඩයක් ඉනිබ්බෙත් ආචාරීභාග අනාාවක්

11. ඉහත සඳහන් පදවල අරුත් පැහැදිළි කළ විට නිවැරදි පිළිවෙල වන්නේ,

I. තල්පතක්, ඉන්පසුවත්, නුසුදුසු ක්‍රියාවක්, ගුරුපඬුරු
II. ගුරු පඬුරු, තල්පතක්, ඉන් පසුවත්, නුසුදුසු ක්‍රියාවක්
III. තල්පතක්, ඉන්පසුවත්, ගුරු පඬුරු, නුසුදුසු ක්‍රියාවක්
IV. ගුරු පඬුරු නුසුදුසු ක්‍රියාවක්, තල්පතක්, ඉන් පසුවත්

12. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන වන්නේ,

I. 30 II. 60 III. 52 IV. 56

13. නුඹලා යන පදය අයත් වන්නේ,

I. උත්තම පුරුෂ ඒක වචනයට යි. II. ප්‍රථම පුරුෂ බහු වචනයට යි.

III. උත්තම පුරුෂ බහු වචනයට යි. IV. මධ්‍යම පුරුෂ බහු වචනයට යි.

14. පහත එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියා පදය අයත් ක්‍රියා පද වර්ගය අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

- ❖ හිවලා මර ළතෝනි **නඟමින්** මොර ගෑවේ ය.
- ❖ බිරිය අස්හලට **ගොස්** පෝනියෙකු පිළියෙල කර ගත්තා ය.
- ❖ ව්‍යාඝ්‍රයා දතුත්, නියත් මුවහත් **කරයි**.

i. අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා ii. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

iii. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, iv. මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා

15. මහ පුදුමෙකි.

මලක මලෙකි.

මෙහි උපයුක්ත කාව්‍ය උපක්‍රමය වන්නේ,

i. උපමාව කි. ii. රූපකය කි. iii. එළිවැට යි. iv. අනුප්‍රාසවත් යෙදුම කි.

16. කිසිවෙකුට බැඳීමක් නැති යන අරුත් ගැන්වෙන තනි පදය වන්නේ,

i. නොබැඳි ii. අන්තේවාසික iii. ස්වෛරී iv. තනිකඩ

17. අප සතුව පවතින පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය වන්නේ,

i. ව්‍යාකරණ විමංසාව ii. සද්ධර්මරත්නාවලිය

iii. සිදත් සඟරාව iv. සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය

හිස්තැනට සුදුසු පදය තෝරා යටින් ඉරක් අඳින්න.

18. (කාන්තාවක/කාන්තාවක්) තල වෙලමින් සිටියා ය.

19. බිසව් තොමෝ උයනට (පිවිසියා ය/පිවිසියෝ ය.)

20. නිවැරදිව පද බෙදා දක්වා ඇති වාක්‍යය තෝරන්න.

i. එහි සඤ්ඤක අක්ෂර ද ඇතුළත් වේ.

ii. කාන්තාවන්ට කමත තහංචිය.

iii. එපවත් අසා දිසාපාමොක් ආචාරීහු රාජ්‍යය නොගිවිස්සාහ.

iv. නෙරළු තුර හෙවත් පොල් ගස තාල වර්ගයට අයත් ය.

## II කොටස

- ❖ 01, 02, ප්‍රශ්න අනිවාර්ය වේ.
- ❖ 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්ති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. බිත්ති පුවත්පත සඳහා ඔබ කණ්ඩායමට ලැබුණු තේමාව කුමක් ද?

(ලකුණු 02)

ii. එය සාර්ථකව සකස් කිරීම සඳහා ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදේශ මොනවා ද?

(ලකුණු 02)

iii. බිත්ති පුවත්පතට කරුණු සෙවීම සඳහා උපයෝගීකොට ගත් මාධ්‍ය 04 ක් නම් කරන්න.

(ලකුණු 02)

iv. බිත්ති පුවත්පතට ඔබ කණ්ඩායම ඇතුළත් කළ විශේෂාංග 02 ක් ලියා දක්වන්න.

(ලකුණු 04)

v. ඔබ කණ්ඩායමේ නායකයා තුළ තිබුණු නායකත්ව ලක්ෂණ 02 ක් ලියන්න.

(ලකුණු 04)

vi. එම නිර්මාණය කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු 02 ක් ලියන්න.

(ලකුණු 02)

02. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150නට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

- වැඩිහිටියන් රැක බලා ගනිමු.
- ගෝලීය වසංගත පරදවමු.
- මා ඇසූ රසවත් ම ගීතය.
- මගේ රට මට අගෙයි.
- පරිසරය රැක ගනිමු.

( ලකුණු 14)

03. ලොව පුරා පැතිර යන කොවිඩ් 19 හෙවත් කොරෝනා වසංගතයෙන් පාසල් සිසු සිසුවියන් ආරක්ෂාවන්නේ කෙසේ ද? යන්න පිළිබඳ ව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලෙස ඉල්ලමින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමාට ලිපියක් ලියන්න. පාසල් සෞඛ්‍ය සමාජයේ ලේකම් ඔබ යැයි සිතන්න.

( ලකුණු 10 )

04. පෙළ පොත ඇසුරින් උපුටා ගත් පහත ප්‍රකාශයට පිළිතුරු සපයන්න.

"ඇයි මැණියනි, මම කුමන අන්‍යායක් කළෙම් ද?"

I. එම කෘතිය රචනා වී ඇත්තේ කාගේ ඉල්ලීමකට අනුව ද?

II. මෙම කථාව ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

III. එසේ පැවසුවේ කාට ද?

IV. ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?

(ලකුණු 10)

05. පහත ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

නේක වර්ණ පුෂ්පයන්ගෙන් පිරුණු තුරුලිය චමත්කාරය දනවමින් හැඩ වැඩ වුණේ ය. අතු නමා වැඩෙන සේ පලබර වූ අඹ ගස් බදු ගත් ලේනුන්ගේ කයිතාලම ගම්ගොඩ පුරා පාවෙයි. කජු ගස් බක් මහේදීටත් වඩා පල දරමින් කොල්ලන් කුරුට්ටන් කැඳවා ගන්නට සමත්ව ඇත. අවුරුද්දට පෙර සිටම නැගුණු කෝකිල කූජනය “වෙසක් වෙසක්” යැයි කියනවා වැනිය. කුරුලු කැල ගම පුරා සැරි සරමින් නගන සියොත් ගීයෙන් මට ඇසුණේ “ලුම්බිනි ලුම්බිනි” - සිදුහත් සිදුහත් - “බුදු හිමි බුදු හිමි” යන පදයන් ය. දිනෙන් දින මෝරා වැඩෙන සඳ වෙසක් ළඟයි කියනවා වැන්න.

-අපේ ගමේ විත්ති: පියසේන කහඳගමගේ-

I. ඉහත ජේදයෙන් කතුවරයා වර්ණනා කරන්නේ කුමක් ද?

II. පහත වචනවලට සමාන අර්ථ ඇති පද ඉහත ජේදයෙන් සොයා ලියන්න.
- ❖ ගස් වැල් :-
- ❖ මල් :-
- ❖ කුරුලු :-

III. මෙහි කියැවෙන්නේ කවර මාසයක සශ්‍රීකත්වය ගැන ද?

IV. ජේදයේ සඳහන් උපමාවක් ලියා දක්වන්න.

V. ප්‍රථම පුරුෂ අතීත කාල ඒක වචන ආඛ්‍යාත පදයක් ලියා දක්වන්න.

06. පහත සඳහන් කවි පන්තියේ දෙවෙනි පේළියට ඔබ විසින්ම කවි පදයක් ගලපා ලියන්න.

ලන්ද පුරා හනි හනිකට
ඇවිදින මගෙ අම්මා
.................................
.................................

රෑ නොනිදා පන් පැදුරට
රටා පුරන අම්මා
හෙට හිරු ළග මල් පූදින
සිනා පොදයි අම්මා..

07. පහත ප්‍රහේලිකාව විසඳන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. සි | | | 5. | 6. රි |
| | | | 3. ළ | |
| 2. ක | | | 4. | ද |
| | | | 7. ත | |

හරහට
1. මානවසිංහයන්ගේ පැදි පෙළක් පෙළ පොතෙහි මෙනමින් දැක්වේ.
2. කල්පය යන්නට සමාන පදයකි.
3. පපුව යන්නට සමාන පදයකි.
4. පෞද්ගලික යන්නට සමාන පදයකි.
7. තරුව යන්නෙහි බහු වචන පදය යි.

පහළට
1. චිත්තාකර්ෂණීය, රමණීය යන අරුත දෙයි.
5. අතීත ජන සමාජයෙහි පුද්ගලයෙකු මිය ගිය පසු දෙණ අභියස හිඳ කියැවූ පොතකි.
6. රථය පදවන්නා යන්නට යෙදෙන තනි පදයකි.